දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

.........................................................

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 08 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 03 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත අරමුදල් ශේෂය වූ රු. 10,308,230 , ඊට අදාල ප්‍රධාන ලෙජරයේ ආරම්භක ශේෂය වූ රු. 7,144,255 සමඟ සැසඳීමේදී රු. 3,163,975ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වර්ෂය තුළදී වැඩසටහන් 04 ක් යටතේ මිලදී ගත් රු.2,555,017 ක් වූ ගබඩා ද්‍රව්‍ය, අදාල වැඩ සටහන යටතේ සැපයුම් හා උපකරණ ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකිරීම නිසා වර්ෂය තුළදී සැපයුම් හා උපකරණ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර සමුච්චිත අරමුදල් ගිණුම ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ඉකුත් වර්ෂ 04 ක් වෙනුවෙන් ගෙවා තිබූ එකතුව රු.236,053 ක් වූ විගණන ගාස්තු සමුච්චිත අරමුදලට හර කිරීම වෙනුවට 2014 වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණු වටිනාකමට අමතරව ණයහිමියන් ලෙස ගිණුම්ගත කළයුතු එකතුව රු.98,542 ක් නිරීක්ෂණය විය.

(ඉ) 2014 වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු උපලේඛන අනුව 2014 වර්ෂය සඳහා එකතුව රු.11,704,641 ක් ලැබිය යුතු වුවද, ගිණුම් වල එය රු. 11,634,541ක් ලෙස දැක්වීම නිසා රු.70,100 ක් වර්ෂයේ ආදායම සහ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2013 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.6,000,000 ක් ගිණුමේ දක්වා තිබුණ අතර, ඒ වෙනුවෙන් 2014 වර්ෂයේ දී රු.3,725,603 හා 2015 අප්‍රේල් 08 දින රු. 7,306,713 ක් ලැබී තිබීම නිසා 2013 වර්ෂය සඳහාඌන වෙන්කිරීම රු.5,032,316 ක් නිරීක්ෂණය විය. එහෙත් 2014 වර්ෂයේ ජ' නල් සටහනක් මඟින් මුද්දර ගාස්තු අධි වෙන් කිරීම් ලෙස රු.2,274,397 ක් ගලපා තිබීම නිසා රු.7,306,713 කින් ලැබිය යුතු මුද්දර ගාස්තු සහ සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(උ) වර්ෂය තුළදී පළාත් සභා අරමුදල් හා විමධ්‍යගත අනෙකුත් අමාත්‍යංශ ආධාරමත සභා බල ප්‍රදේශය තුළ ඉටුකරන ලද කර්මාන්ත 251 ක් වෙනුවෙන් ප්‍රාග්ධනආධාර ලෙස ලැබුණු රු. 82,636,161 ක් හා එයින් ප්‍රාග්ධන වියදම් ලෙස වර්ෂය තුළදී වැය කළ රු.64,463,465 ක් පොදු තැන්පත් ගිණුම් හරහා ලැබීම් ගෙවීම් සටහන් කරතිබීම හේතුවෙන් ඒවා අවසන් ගිණුම් වලින් හෙලිදරව් කර නොතිබුණි.

(ඌ) පළාත් පාලන සේවක විශ්‍රාම වැටුප් වෙනුවෙන් 2014 දෙසැම්බර් බිල්පත අනුව ගෙවිය යුතු හිඟ ශේෂය රු. 1,698,773 ක් වුවද , එය ගිණුම් වලින් හෙලිදරව් කර නොතිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම
------------------------------

ගිණුම් විෂයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.21,357,391 ක් වූ අතර ඒවාට අදාල උපලේඛන අනුව ශේෂයන් රු.21,144,174 ක් වූයෙන් රු. 213,217 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙනුවෙන් 2010/11 වර්ෂ වලදී රැස්කළ එකතු කළ අගය මත බදු තැන්පත්, ජාතිය ගොඩනැගීමේ බදු හා රැඳවුම් බදු එකතුව රු.3,015,033 ක මුදල 2015 ජූලි 15 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු ගිණුම් වල දක්වා තිබුණි.

(ආ) 1989 හා 1992 සිට පැවත එන හිඟ කසළ බදු, කඩකුලී හා දඩ ,මස්කඩ මාළුකඩ හා දඩ එකතුව රු.103,408 ක් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ලැබිය යුතු ශේෂය යටතේ දක්වා තිබුණි.

1.3.4 නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව</u> | | <u>අනුකූල නොවීම</u> |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මු.රෙ.371 | - | 2011 හා 2012 වර්ෂ වලදී ලබාදුන් එකතුව රු.52,839 ක තත්කාර්ය අතුරු අග්‍රිම 02 ක් 2015 ජූලි 15 දින දක්වාම පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ.396 (ඇ) | - | නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ එකතුව රු.190,840 ක් වූ චෙක්පත් 14ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,591,446 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,699,514 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,891,932 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.
සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | 2014.12.31 දිනට හිගය | | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිගය | මුළු හිගය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| iවරිපනම් හා බදු | 3,901 | 750 | 4,046 | 1,528 | 3,151 | 2,518 | 5,669 |
| ii බදු කුලී | 83 | 6 | 3,250 | 3,250 | 77 | - | 77 |
| iii බලපත්‍ර ගාස්තු | 135 | 20 | 667 | 667 | 115 | - | 115 |
| ivවෙනත් ආදායම් | 10,753 | 6,761 | 32,488 | 16,759 | 3,992 | 15,728 | 19,721 |

#### 2.2.2 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපිත කළ දිනයේ සිට සම්ප්‍රේෂණය කරනු ලබන සේවාවන් වෙනුවෙන් වාර්ෂික ව්‍යාපාර බදු අයකිරීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට හා ඊට පෙර වර්ෂය වෙනුවෙන් රු.42,000 ක ගාස්තු අයකර නොතිබුණි.

2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

-------------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු යටතේ ශේෂය රු.114,908 ක මුදලින් රු.101,511 ක් වසර 05 ට වඩා වැඩි පැරණි හිඟ මුදල් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු.4,000,000 වූ අතර , ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.11,704,541 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා සේවකයන් තුන් දෙනෙකුගෙන් ලැබිය යුතු රු.75,526 ක සේවක ණය ශේෂයක් දීර්ඝ කාලයක සිට අයනොවී පැවතිය ද හිඟ ණය මුදල් අයකර ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි. ඒ තුළ වැඩ තහනමට ලක්වී ඇති කාර්මික නිලධාරිවරයෙකුගෙන් අයවිය යුතු රු. 46,525 ක ණය ශේෂයක් විය.

(ආ) ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආදායම තුළ දක්වා තිබුණු හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගෙන් 2012 වර්ෂයේදී ලබාගත් යතුරු පැදි ණය වෙනුවෙන් අයවිය යුතු හිඟ මුදල රු.70,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලද එකතුව රු. 1,655,818 ක මුදලක් භාවිතා කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) බැකෝ යන්ත්‍රය භාවිතය සම්බන්ධයෙන් පවත්වා තිබූ බැංකු ගිණුම අනුව එහි වර්ෂයේ ආදායම රු.874,930 ක් වුවද, වියදම රු.651,152 ක් විය .ඊට අමතරව බැකෝ යන්ත්‍රය සඳහා යොදන ඉන්ධන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,212,756 ක් හා අනෙකුත් අළුත්වැඩියා සඳහා රු.970,732 ක් සභාවේ පොදු ගිණුමට හර කර තිබුණු අතර, එකී වියදම් සලකා බැලූ විට බැකෝ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම නිසා රු. 1,959,855 ක මෙහෙයුම් අලාභයක් නිරීක්ෂණය විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

දෙහිඕවිට කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ ආරක්ෂිත වැට ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 01 පරිදි නොකළ වැඩ වෙනුවෙන් රු. 24,274 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබූ අතර, මිණුම් වාර්තාවේ වැඩ විෂය අංක 02 පරිදි කළු ගලෙන් බැම්ම බැඳීම සඳහා කියුබ් 59.56 ක් සඳහා රු. 1,586,260 ක් ගෙවා ඇතත්, කර්මාන්තය භෞතික පරීක්ෂාවේදී සක්ක ගලින් කියුබ් 48.9 ක් බැම්ම බැඳ තිබුණ අතර, ඉටු නොකරන ලද කියුබ් 11.47 ක් සඳහා රු.305,570 වැඩියෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

වැය විෂයන් 68 ක එකතුව රු. 16,114,500 ක මුළු ප්‍රතිපාදිත මුදලම ඉතිරිකර තිබූ අතර වැය විෂයක ප්‍රතිපාදනය රු.13,000 කින් ඉක්මවා වැය කර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය